**ශීර්ෂය 278 - රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 278 - රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 09 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 08 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලේඛනාගාරයේ රාක්ක සකස් කිරීමට සමාලෝචිත වර්ෂය තුළ ගෙවූ රු. 1,566,312ක් ප්‍රාග්ධනීත කර නොතිබුණි. | වැඩි දියුණු කිරීමක් ලෙස සලකා ගොඩනැගිලි හා ඉදිකිරීම් ලෙස ගිණුම්ගත කර ඇත. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ශේෂ පිරික්සුමට අනුව යන්ත්‍රෝපකරණ මිල දී ගැනීමට වැය කළ මුදලට වඩා රු.410,433ක් අඩුවෙන් එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02ක් විසින් සිදු කළ ද්විගණන දෝෂයකි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඇතුළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 18ක තොරතුරු අනුව මූල්‍ය නොවන වත්කම් ශේෂවල එකතුවට වඩා රු.45,905,518ක් වැඩියෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය දක්වා තිබුණි. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02ක ගිණුම්කරණ දෝෂ මීට හේතු වී තිබුණි. | උප ආයතනවල තොරතුරු සමඟ මූල්‍ය ප්‍රකාශන සැසඳිය හැකි විය යුතුය. |
| (ඈ) | මූල්‍ය ප්‍රකාශන අනුව මූලධන වත්කම් අත්පත් කර ගැනීම්වලට වඩා රු. 14,956,813ක් වැඩියෙන් එම වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා තිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය වාර්තා සකස් කිරීමේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 බැරකම් හා බැදීම්වලට එළැඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 94(i) හා අංක 255/2017 හා 2017 අප්‍රේල් 27 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2(අ) ඡේදයට පටහැනිව, වැය විෂයයන් 07ක් වෙනුවෙන් රු.6,546,034ක බැදීම් සඳහා එළැඹ තිබුණි. | බිල්පත් නිසි පරිදි නොලැබීම හා භාණ්ඩාගාර ප්‍රතිපාදන නොලැබීම මීට හේතු වී තිබුණි. | අදාළ නීතිරීති අනුව කටයුතු කළ යුතු වේ. |

## 2.2 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ස්ථාන මාරු වී ගිය, විශ්‍රාම ගිය, සේවය හැර ගිය, මියගිය හා වැඩ තහනම් කළ නිලධාරීන් 18 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 2,483,201 ක ණය ශේෂය මාස 05 ත් වර්ෂ 14 ත් අතර කාලයක් පැරණි විය. | ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කරන බව. | නොපමාව ණය අයකළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 16ක 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ විකල්ප ඉඩම් ලබා දීමට හඳුනාගත් පවුල් සංඛ්‍යාව 2434 ක් වුවද, ඉන් පවුල් 791කට 2022 දෙසැම්බර් 31 දින දක්වාම ඉඩම් ලැබී නොතිබුණි. | යෝජිත ඉඩම් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මගින් නිර්දේශ නොකිරීම, ඉඩම් විකුණා තිබීම, එම ඉඩම්වල පදිංචියට ප්‍රතිලාභීන් තුළ උනන්දුවක් නොමැති වීම හා නීතිමය ගැටළු මීට හේතු වී තිබුණි. | අත්පත් කරගත් ඉඩම්වල මිනින්දෝරු වාර්තා ලබාගෙන ඉඩම් ලබා දීමට පියවර ගත යුතුය. |
| (ආ) | ගංවතුර හා නායයෑම් නිසා හානියට පත් නිවාස වෙනුවෙන් 2022 දෙසැම්බර් 31 වන විට ගෙවිය යුතු මුදල රු.464,881,102ක් විය. 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ගෙවිය යුතු රු.312,437,884ක ශේෂයක් ද මෙම හිඟහිටි ශේෂය තුළ පැවැතිණි. | ප්‍රතිපාදන හා අක්මුදල් නොලැබීම, අසම්පූර්ණ අයදුම්පත් ලබාදීම හා අයදුම්පත් යොමු නොකිරීම මීට හේතු වී තිබුණි. | අක් මුදල් ලද විගස ගෙවීම් නිම කළ යුතු වීම. |

## 3.2 ප්‍රමාණවත් පරිදි ඉටු නොකළ ව්‍යාපෘති

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05ක් මගින් 2021 හා 2022 වර්ෂවල දී ප්‍රතිලාභීන් 63 දෙනෙකු වෙත රු.28,925,000ක් නිවාස ආධාර ලෙස ලබා දී තිබුණි. ඒ සඳහා ලිපිගොනු පවත්වා නොතිබුණු අතර, ප්‍රතිලාභී ඉල්ලීම් ද නොතිබුණු අවස්ථා පැවැතිණි. එමෙන්ම, හිමිකම නිරවුල් වී නොතිබුණු ඉඩම් 24 ක් වෙනුවෙන් ද ණය නිකුත් කර තිබුණි. ඒ හැර පවුලේ අවම සාමාජික සංඛ්‍යාව, වැන්දඹු හෝ ආබාධිත අයට ප්‍රමුඛතාව ලබා දීම හා කාර්මික නිලධාරී නිර්දේශ නොමැතිව ණය නිකුත් කර තිබීම ආදී කරුණු මත, සුදුසු ප්‍රතිලාභීන් වෙත ණය නිකුත් කළේද යන්න අවිනිශ්චිත විය. | ඉදිරියේදී මෙම අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව | ආධාර ලබා දීමේදී අවශ්‍ය කොන්දේසි සපුරා ඇත්ද යන්න සලකා බැලිය යුතුය. |
| (ආ) | කුරුවිට, ඇළ මාර්ග 02ක ඉවුරු නිසි පරිදි සකස් කර නොතිබීමත්, ඇළ කැපීමෙන් එය වෙල්යායට වඩා පහත් වීමත් නිසා කුඹුරුවලට ජලය පහසුවෙන් ලබාගත නොහැකි වීමෙන් ඒ වෙනුවෙන් වැයකළ රු.1,941,748කින් ප්‍රමාණවත් ප්‍රගතියක් ලැබී නොතිබුණි. | එක් ඇළක රොන්මඩ පමණක් ඉවත් කර තිබුණි. මෙවැනි දෑ යළි ඇති නොවීමට කටයුතු කරන ලෙස කාර්මික නිලධාරීන්ට උපදෙස් ලබා දී තිබුණි. | වැයකළ මුදලට ප්‍රමාණවත් උපයෝජනයක් තිබිය යුතු වේ. |

## 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 කට අදාළව වාහන 03ක්, වතුර මෝටර් ඇතුළු විවිධ යන්ත්‍ර උපකරණ 47 ක් වසර 05 ක පමණ කාලයක සිට භාවිතයට නොගෙන පවතී. | දිස්ත්‍රික් ලේකම්ගේ උපදෙස් පරිදි ඉදිරියේදී කටයුතු කරන බව. | වත්කම් භාවිතයට නොගෙන නොතැබිය යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 10 ක වූ රජයේ ගොඩනැගිලි 79 ක් අභාවිතව පැවතුණි. | අබලන්වීම, නාය යෑමේ අවදානම් ආදී දෑ මීට හේතු වී තිබුණි. | වත්කම් අභාවිතව නොතැබිය යුතු වේ. |

## 3.4 පාඩු හා හානි

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට නොලද සංවෘත පරිපථ රූපවාහිනී කැමරා (CCTV Camera) 04 ක් වෙනුවෙන් රු.209,383 ක් ගෙවා තිබුණි. | එම කැමරා සවි කරන ලෙස කොන්ත්‍රාත්කරු දැනුවත් කර ඇති බව. | වැඩ සහතික කර ගැනීමෙන් පසු ගෙවීම් කළ යුතුය. |
| (ආ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සවිකළ විදුලි සෝපානයේ අභ්‍යන්තර පළල අඩුවීම නිසා රු. 212,273 ක් නොකළ වැඩ වෙනුවෙන් ගෙවා තිබුණි. | කොන්ත්‍රාත්කරුගෙන් රු.26,786 ක් අඩු කරන බව | රු.212,273 ක් අයකළ යුතු වේ. |
| (ඇ) | සමස්ත අවශ්‍යතාව පිළිබඳ සැලකිලිමත්ව අවශ්‍ය භාණ්ඩ එක්වර මිළ දී ගන්නේ නම්, එක්වර වැඩි ඒකක ප්‍රමාණයක් මිල දී ගැනීමේ දී ඇතිවන මිලෙහි වාසිය ලබාගත හැකිව තිබුණ ද, වරින්වර පරිගණක 32ක් මිල දී ගැනීම නිසා රු.1,475,600 ක් වැඩිපුර ගෙවා තිබුණි. | වසංගත තත්ත්වය, ආනයන සීමා, වෙලඳපොළ තොග හිඟය ආදිය නිසා මිල දී ගත නොහැකි වී තිබුණි. | සැලැසුම් සහගතව කටයුතු කළ යුතු වේ. |
| (ඈ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක කර්මාන්ත 07 ක් සඳහා රු.590,886 ක් වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවීම් රැඳවුම්වලින් අඩු කිරීම හා මෙවැනි දෑ සිදු නොවීමට නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. එක් කර්මාන්තයක් සඳහා රු.119,906 ක වැඩිපුර ගෙවීමක් සිදු වී නොතිබුණි. | වැඩිපුර ගෙවීම් අයකළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විදුලි පරිපථ පුවරුව ගිනි ගැනීමෙන් රු.4,143,204 ක හානියක් සිදු වී 2023 මාර්තු මාසයට මාස 14 ක් ගත වී තිබුණද, මුදල් රෙගුලාසි 104 පරිදි වගකීම නිශ්චය කර හානිය ප්‍රතිපූරණය කර ගැනීමට ඇති හැකියාව සොයා බලා නොතිබුණි. | මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු වෙමින් පවතී. | මුදල් රෙගුලාසි පරිදි කටයුතු කළ යුතු වේ. |

## 3.5 අනාර්ථික ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කිරිඇල්ල හොලීපිටිය පුරාණ ගල්ලෙන් විහාරස්ථානයේ ගොඩනැගිල්ලක් ඉදිකිරීමට කොන්ක්‍රීට් කණු 12ක් යොදා ඉදිකිරීම් අතහැර දැමීම නිසා ඒ වෙනුවෙන් ගෙවූ රු.346,318ක් අනාර්ථික වියදමක් වී තිබුණි. | ආර්ථික අර්බුදය නිසා අත්‍යාවශ්‍ය නොවූ ව්‍යාපෘති අත්හිටුවීමට මුදල් අමාත්‍යාංශ උපදෙස් ලැබීම. | අඩක් ඉදිකළ කර්මාන්ත නිම කළ යුතු වේ. |
| (ආ) | කුරුවිට, කාහේන්ගම පිහිටි සේවා පියස ගොඩනැගිල්ල විදුලිය හා ජලය නොමැතිකමින් වර්ෂයකට අධික කාලයක සිට අභාවිතව පැවැතීම නිසා ඒ වෙනුවෙන් වැය කළ රු.1,165,048ක් අනාර්ථික ගනුදෙනුවක් වී තිබුණි. | ඉදිරියේදී අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව. | සංවර්ධන ව්‍යාපෘති කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව ඉටුකළ යුතුය. |
| (ඇ) | රත්නපුර, බටුගෙදර, හල්ගස්යායේ පුරන් වූ කුඹුරු අක්කර 20 ක් අස්වැද්දීමට රු.1,164,000 ක් වැයකර 2022 ජුනි මාසයේ දී එම වෙල්යායට ජලය සපයන වේල්ල ප්‍රතිසංස්කරණය කර තිබුණි. එහෙත්, 2022 සැප්තැම්බර් වන විටත් ගොවීන් දෙදෙනෙකු පමණක් අක්කර 1¼ ක පමණ කැළයක් එළිපෙහෙලි කිරීම හැර වෙනත් ප්‍රගතියක් නොවුණි. | මේ සම්බන්ධයෙන් ගොවිජන සේවා කාර්යාලය සහ වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය දැනුවත් කළ බව | සංවර්ධන ව්‍යාපෘති කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව ඉටුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | රත්නපුර ප්‍රදේශයේ ක්‍රියාත්මක කළ කාබනික එනසාල් වගා කිරීමේ ව්‍යාපෘතිය යටතේ 2021 වර්ෂයේ ඉදිකළ රු.1,891,548 ක් වූ වියලන මධ්‍යස්ථානයත්, රු.400,000 ක් වූ වියලන යන්ත්‍රයත් එදින සිටම අභාවිතව පැවතිණි. මෙම ව්‍යාපෘතිය සඳහා සාධ්‍යතා අධ්‍යයනයක් සිදුකර නොතිබුණු අතර ප්‍රගතිය පිළිබඳ කිසිදු පසුවිපරමක් සිදුකර නොතිබුණි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ ප්‍රදේශයේ ගෙවතුවල පුද්ගලික පරිභෝජනය සඳහා එනසාල් පැළ 02 ක් හෝ 03 ක් පමණක් වගාකර ගෙන සිටින පවුල් 20 ක් පමණ සිටින බව භෞතික පරීක්ෂාවේ දී තහවුරු විය. | ඉදිරියේ මෙම ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට කටයුතු කරන බව. | වැය කළ මුදලට ප්‍රමාණවත් ප්‍රතිලාභයක් ලැබිය යුතුය. |

## 3.6 නිෂ්ඵල වියදම්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කහවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කිකිළි පැටව් 785 ක් බෙදාහැර තිබුණි. ඉන් පැටව් 589 දෙනෙකු එනම්, සියයට 75 කට වැඩි ප්‍රතිශතයක් රෝග වැළදීම වැනි හේතු මත මුල් කාලයේ දී ම මිය ගොස් තිබුණි. මේ නිසා එම පැටව් මිළ දී ගැනීමට වැය කළ රු.270,940 ක් නිෂ්ඵල වියදමක් වී තිබුණි. එමෙන්ම, සාමාන්‍ය වශයෙන් කිකිළියන්ට කුකුළන්ගේ අනුපාතය 9:1 ක් වියයුතු වුවත්, එය 3:2 ක් ලෙස අතාත්වික අගයක් ගෙන තිබුණි. පශු සම්පත් පිළිබඳ ප්‍රවීනතාවක් සහිත නිලධාරියෙකුගේ අධීක්ෂණයක් මෙම ව්‍යාපෘතිය ආරම්භයේ සිටම නොමැති වීම මීට හේතුව වී තිබුණි. | ප්‍රතිලාභීන්ට පාලනය කළ නොහැකි හේතු හා ප්‍රතිලාභීන්ට නිරන්තරව පශු වෛද්‍ය කාර්යාලයට පැමිණීමේ අපහසුව මත අපේක්ෂිත අරමුණ ඉටු වී නොතිබුණි | සංවර්ධන ව්‍යාපෘති කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව ඉටුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කුරුවිට, කඳන්ගොඩ ප්‍රදේශයේ වූ ඇළක් කපා දෙපස සකස් කර වර්ෂයක් ගත වීමට පෙර එවැනි කාර්යයක් ඉටු කළේ ද යන්න පවා දැකගත නොහැකි ලෙස දෙපස ඉවුරු කැඩී වල් බිහි වී පැවැතුණි. මේ නිසා ඒ වෙනුවෙන් දරන ලද රු. 1,892,459ක් නිෂ්ඵල වියදමක් වී තිබුණි. | ඇළ මාර්ගය නඩත්තු කර පවත්වාගෙන යාමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ගොවිජන සංවර්ධන නිලධාරී දැනුවත් කර ඇත. | සංවර්ධන ව්‍යාපෘති කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව ඉටුකිරීම කළ යුතුය. |

## 3.7 කළමනාකරණ දූර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කිරිඇල්ල නව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා නිල නිවස ඉදිකිරීම සඳහා යෝජිත ඉඩම සියයට 45ක නායයෑමේ අවදානමක් පවතින බවට ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් වාර්තාකර තිබුණ ද, එම ඉඩම පවරා ගැනීමේ කටයුතු තවදුරටත් ඉටු කරමින් පවතී. | මෙම ඉඩම නැවත එම සංවිධානය වෙත පරීක්ෂාවක් සඳහා යොමු කරන බව. | නායයෑමේ අවදානම පිළිබඳව අවධානය යොමුකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | ඉඹුල්පෙ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ක්‍රීඩා පිටි 02 ක් සංවර්ධනය කිරීමට පළාත් පාලන ආයතනවල යන්ත්‍රසූත්‍ර හා ශ්‍රම දායකත්වය ලබා ගත යුතු බවට ප්‍රතිපාදන ලබාදුන් අමාත්‍යාංශය විසින් උපදෙස් දී තිබුණ ද, රු.823,902 ක් ගෙවා කොන්ත්‍රාත්කරුවන් මඟින් එම කාර්යයන් ඉටුකර තිබුණි. | මේ සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවෙන් විමසා ඇති අතර පිළිතුරු ලද පසු ඉදිරිපත් කරන බව. | අදාළ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. |

## 3.8 මෙහෙයුම් දූර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක වර්ෂ 02ක ඉක්ම වූ එකතුව රු. 54,398,346 ක් වටිනා තැන්පතු 627 ක් නිරවුල් කර නොතිබුණි. | අග්‍රිම නොලැබීම මීට හේතු වී තිබුණි. | මුදල් රෙගුලාසි 571 අනුගමනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් 2022 වර්ෂය තුළ රජයේ ඉඩම් සඳහා බලපත්‍ර හා දීමනාපත්‍ර නිකුත් කිරීමේ දී, කාර්යාල 02 ක ඉඩම් කච්චේරි නොපැවැත්වීමත්, කාර්යාල 06 ක පවත්වන ලද ඉඩම් කච්චේරි ගණන 04 සිට 06 ක් තරම් අඩු පරාසයක් ගෙන තිබීමත්, කාර්යාල 02 ක් විසින් අනවසර ඉඩම්වලින් නියමානුකූල කිරීමට තිබූ ඉඩම් ප්‍රමාණය හඳුනා නොගැනීමත්, හේතුවෙන් රත්නපුර දිස්ත්‍රික්කය තුළ අනවසර ඉඩම් නියමානුකූල කිරීමේ ක්‍රියාවලිය මන්දගාමී ස්වරූපයක් ගෙන තිබුණි. | ඉඩම් නියමානුකූල කිරීමේ කටයුතු ඉදිරියේදි විධිමත් පරිදි සිදු කරන බව. | ඉඩම් නියමානුකූල කිරීමේ ක්‍රියාවලිය කඩිනමින් අවසන් කළ යුතු ය. |
| (ඇ) | ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ 04ක වූ සමෘද්ධි බැංකු 13කින් ලබා දුන් මුළු ණයවලින් 2022 නොවැම්බර් 30 දිනට රු.162,205,520ක කල්පසු වූ ණය සහ රු.45,244,077ක බොල්ණය පැවතිය ද ඒවා අයකර ගැනීමට පැහැදිලි වැඩපිළිවෙලක් නොතිබුණි. | ණය අයකර ගැනීමටත් විනය පරීක්ෂණ පැවැත්වීමටත් කටයුතු කෙරේ. | හිඟ ණයශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ඇලපාත හා කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට අයත් පලාවෙල - දිමියාව මාර්ගය හා මිල්ලකඩේ පන්සල පාර අලුත්වැඩියාව 2019 වර්ෂයේදී නිමකර තිබුණ ද, එම මාර්ගවල ඉරිතැලීම් හා පළුදුවීම් පැවැතිණි. ඒවා නැවත පිළිසකර කිරීමට රු.919,499ක් රඳවාගෙන තිබුණ ද, 2019 වර්ෂයේ සිට මේ දක්වා වර්ෂ 04ක් ගත වී ඇතත් අවශ්‍ය පිළියම් සිදුකර නොතිබුණි. | මාර්ග සංවර්ධන අධිකාරියෙන් මේ සම්බන්ධයෙන් විමසීම් කර ඇත. | - ව්‍යාපෘතිය නියමිත ප්‍රමිතියෙන් යුතුව ඉටු නොකළ කොන්ත්‍රාත්කරු සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය.<br>- මාර්ගය කඩිනමින් පිළිසකර කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 09 ක් විසින් 2022 දෙසැම්බර් 15 දිනට විශ්‍රාම වැටුප් රු.10,180,455 ක් වැඩියෙන් ගෙවා තිබුණි. | මේ වනවිට අයකරමින් පවතින බව | වැඩිපුර ගෙවීම් කඩිනමින් අයකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 ක ඇප තැබිය යුතු නිලධාරීන් 33 දෙනෙකුගෙන් ඇප මුදල් ලබා ගෙන නොතිබුණි. | ඇප මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි 880 අනුව ඇප ලබාගත යුතු වේ. |

## 3.9 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වාහනයකට වූ රු.292,897ක හානිය කපාහැරීමට තීරණය කිරීම වැරදි සහගත බව ඔම්බුඩ්ස්මන්වරයා විසින් දක්වා තිබුණ ද, එම ශේෂය පොත්වලින් කපාහැර තිබුණි. | මේ සම්බන්ධයෙන් නැවත පරීක්ෂණයක් පැවැත්වීමට මණ්ඩලයක් පත්කර ඇත. | නොපමාව කටයුතු කළයුතු වේ. |
| (ආ) | සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සිය වගකීම් නිසි පරිදි ඉටුකර නොතිබීම නිසා ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ උප්පැන්න, විවාහ, හා මරණ රෙජිස්ට්‍රාර් ධූරය සඳහා කළ පත්වීම මතභේදාත්මක විය. | අදහස් දක්වා නොතිබුණි. | සම්මුඛ පරීක්ෂණ ඉතාමත් නිවැරදිව හා අපක්ෂපාතීව සිදු කළ යුතුය. |
| (ඇ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය ගොඩනැගිල්ලක පවත්වා ගෙන යන ආපන ශාලාවෙන් හා සුභසාධන වෙළඳසැලෙන් 2013 - 2022 වර්ෂ අතර කාලය තුළ ලද ගොඩනැගිලි කුලී රු. 2,671,760ක් සුභ සාධන සංගමයක් වෙත ලබා දී තිබුණි. මෙම කුළී ගාස්තු රජයේ ආදායමක් ලෙස හඳුනාගෙන නොතිබුණු අතර රජයේ ගොඩනැගිල්ලකින් උපයන කුළී ආදායම් සුභ සාධක සංගමයකට ලබා දීමට පවතින නෛතික හැකියාව සනාථ කරගත නොහැකි විය. එමෙන්ම, කිසිදු ටෙන්ඩර් කැඳවීමකින් තොරව 2020 වර්ෂයේ සිට මේ දක්වාම එකම කොන්ත්‍රාත්කරු විසින් ආපනශාලාව පවත්වා | ඉදිරි කුලී ආදායම් රාජ්‍ය ආදායමට බැර කිරීමටත්, ජල හා විදුලි බිල්පත් අයකර ගැනීමටත් කටයුතු කෙරේ. | රජයේ ආදායම් නොපමාව අයකර ගත යුතු වේ. |

ගෙන යන අතර, ඔහු විසින් 2022 හා 2023 වර්ෂ සඳහා රු. 60,533ක ජල බිල්පත් ද, සුභසාධන වෙළඳසැලෙන් රු.35,459ක විදුලි බිල්පත් ද පියවා නොතිබුණි.

**4. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අතිරික්ත සේවකයන් 197 දෙනෙකුගේ සේවා අවශ්‍යතාව හඳුනාගෙන අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට හෝ ඵලදායි ලෙස වෙනත් ආයතන වෙත අනුයුක්ත කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | පවතින පුරප්පාඩු නොසලකා රේඛීය අමාත්‍යාංශය විසින් මෙම අනුයුක්ත කිරීම සිදුකර තිබුණි. | මුදල් රෙගුලාසි 71 ප්‍රකාරව අදාළ තනතුරු අනුමත කරගත යුතුය. |